රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/17
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.05.13

## වාවස්ථාපිත ආයතනවල පුරප්පාඩු ලෙස පවතින තනතුරු සඳහා සංවර්ධන නිලධාරීන් ද්වීතියන පදනම මත මුදාහැරීම

පහත අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනවල පුරප්පාඩු ලෙස පවතින තනතුරු සඳහා ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරීන් ද්වීතියන පදනම මත වසර දෙකක කාලයකට මුදාහැරීම සම්බන්ධවයි.

- සෞඛ්‍ය අමාත්‍යාංශය
- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (පළාත් සභා හා පළාත් පාලන අංශය)

❖ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 172 වගන්තිය ප්‍රකාරව ද්වීතියන පදනමින් ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත නිලධරයන් මුදා හැරීමේදී සේවය ස්ථිර කර සිටීම මූලික අවශ්‍යතාවයක් වන බැවින් මේ සමඟ පළ කර ඇති පුරප්පාඩු සඳහා මේ වන විට පත්වීම ස්ථිර කර ඇති නිලධාරීන් පමණක් තාවකාලික පදනමින් මුදාහැරීමට හැකියාව ඇත.

❖ අදාළ ව්‍යවස්ථාපිත ආයතනය පිහිටුවීමේ පනතෙහි ද්වීතියන පදනම මත සේවය ලබා ගන්නා නිලධරයන්ට ගෙවිය යුතු දීමනා පිළිබඳ විශේෂයෙන් සඳහන් නොවන්නේ නම්, රාජ්‍ය සේවයේ නිලධරයෙකු ද්වීතියන පදනම මත ව්‍යවස්ථාපිත ආයතන රාජකාරී සඳහා විධිමත් පරිදි මුදාහැර ඇති විට නිලධාරියාගේ වැටුප ලෙස ද්වීතියන දීමනාව ගණනය කරනු ලබන දිනට නිලධාරියාට ගෙවිය යුතු නිත්‍ය තනතුරට අදාළ වැටුපත්, එම වැටුපෙන් 25%කුත් ගෙවිය හැකි බව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-5/07/SAL/0012 හා 2023.08.08 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

❖ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 181 වගන්තිය ප්‍රකාරව රජයේ සේවයෙන් පරිබාහිර මෙම තනතුරක් සඳහා තාවකාලිකව මුදාහරින ලබන්නේ රජයේ අවශ්‍යතාවයක් මත වන බැවින් නිලධාරියා විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 10(1) වන වගන්තියේ කාර්යයන් සඳහා රජයේ ප්‍රතිපත්තිමය හේතූන් මත වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේ සලකා ක්‍රියා කරනු ලබන අතර එසේ මුදාහරිනු ලද කාලපරිච්ඡේදයක් ඕනෑම කාර්යයක් සඳහා සක්‍රීය සේවා කාලයක් ලෙස ගණනය කරනු ලැබේ.

04. ඒ අනුව, ඇමුණුම-01හි දක්වා ඇති පුරප්පාඩු සඳහා අනුයුක්තවීමට කැමැත්ත පළ කරන ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරීන් සිටී නම් සංවර්ධන නිලධාරී සේවයට පත් කරමින් නිකුත් කර ඇති පත්වීම් ලිපියේ අංකය හා පත්වීම් දිනය ඇතුළත් වන පරිදි සකස් කරන ලද තම ජීව දත්ත පත්‍රිකාවක් හා අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම් සඳහා වන ලේඛනවල සහතික කළ පිටපත් සමඟ ඇමුණුම-02 ප්‍රකාරව සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයක් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව 2024.05.31 දිනට පෙර ඇමුණුම-01හි දක්වා ඇති පරිදි අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය වෙත යොමු කිරීමට හෝ එම ලේඛනවල මෘදු පිටපතක් (PDF Document) ඇමුණුම-01හි දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

05. තවද මෙම පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැක්කේ ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන්ට පමණක් බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම - 01

| | අමාත්‍යාංශය | ආයතනය | පුරප්පාඩු තනතුරු ගණන | අධ්‍යාපන සුදුසුකම් | අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය | තොරතුරු විමසිය හැකි දුරකථන අංක |
|---|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය අමාත්‍යාංශය | දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය | 02 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් හදාරා තිබීම. | සභාපති,<br>දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය,<br>11 වන මහල- ඒ කොටස,<br>සෙත්සිරිපාය දෙවන අදියර,<br>බත්තරමුල්ල.<br><br>විද්‍යුත් තැපැල -<br>natamoh.lk@gmail.com | 0112187140<br>රුවිනි වන්නිනායක මෙය සංවර්ධන නිලධාරී |
| 02 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (පළාත් සභා හා පළාත් පාලන අංශය) | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | 05 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හදාරා තිබීම. | අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිලධාරී,<br>පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය,<br>අංක 17,<br>මලලසේකර මාවත,<br>කොළඹ 07.<br>විද්‍යුත් තැපැල -<br>director@slilg.gov.lk | 0112508290<br>ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී |

ඇමුණුම - 02

**...................................................................................... අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ........................................................................ ආයතනයෙහි පවතින පුරප්පාඩු සඳහා අනුයුක්තවීමට අයදුම් කිරීම**

## I කොටස

(නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුයි)

1. නිලධාරියාගේ නම :- ..............................................................................මෙය/මිය/මයා
2. ජාතික හැඳුනුම්පත් අංකය :- .............................................................................................
3. පත්වීම් අංකය :- .............................................................................................
4. පත්වීම් දිනය :- .............................................................................................
5. පත්වීම ස්ථිර කර ඇත/නැත :- .............................................................................................

---

## II කොටස

(නිලධාරියා සේවය කරනු ලබන ..........................................................................................
අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි)

.......................................................................................................... නිලධාරියා/නිලධාරිනිය ........................................ දින සංවර්ධන නිලධාරි සේවයේ පත්වීම ස්ථිර කර ඇති අතර මෙම නිලධාරියා/නිලධාරිනිය ............................................................................... ආයතනයේ තනතුරක් සඳහා තෝරා ගනු ලැබුවහොත් අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව සේවයෙන් නිදහස් කිරීමට හැකියාව ඇති බව නිර්දේශ කරමි.

අත්සන: ..................................................

නිලමුද්‍රාව : ...............................................

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය இணைந்தசேவைகள்பிரிவு **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/17
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 13.05.2024

**Release of Development Officers on the secondment basis for posts that have fallen vacant in the statutory institutions**

This is with reference to the release of Development Officers of the Combined Service on secondment basis for a period of two years for the posts that have fallen vacant in the statutory institutions that function under the following ministries.

- Ministry of Health
- Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government (Provincial Councils and Local Government Division)

❖ As it is a basic requirement for officers to have been confirmed in their posts when they are released on secondment basis to a statutory bodies as per Section 172, Chapter XII of the Procedural Rules of the Public Service Commission, only the officers who have been confirmed in their posts can be released on a temporary basis to the vacant posts published herewith.

❖ It has been informed by the letter of the Director General of Establishments No. EST-5/07/SAL/0012 dated 08.08.2023 that the salary relevant to the officer's substantive post to be paid to the officer as at the date on which the secondment allowance is calculated, along with 25% of that salary, can be paid as the salary to a public officer who has been released in the formal manner on secondment basis to serve in a statutory bodies, in cases where no specific mention has been made in the Act on the establishment of the relevant statutory bodies regarding the allowances to be paid to the officers whose service is obtained on secondment basis.

❖ As per Section 181, Chapter XII of the Procedural Rules of the Public Service Commission, an officer is temporarily released to a post outside the public service on the need of the government, and therefore, he shall be deemed to have been on no pay leave on grounds of public policy for the purpose of Section 10 (I) of the Minutes on Pensions, and any period involving such release shall be reckoned as an active period of service for any purpose whatsoever.

04. If there are Development Officers of the Combined Service who are willing to be attached to the posts indicated in Annex 01 that have fallen vacant, they are kindly informed to send their Bio Data prepared with the inclusion of the number of the appointment letter issued for the appointment to the Development Officers' Service and the date of appointment, the certified copies of the documents to prove the educational qualifications and a form completed as per Annex 02, along with the recommendations of the Head of the Institution, to the address to which the applications should be sent as indicated in the Annex 01 or send the soft copies (PDF) of the said documents to the email address indicated in the Annex 01 before 31.05.2024.

05. It is further informed that only the Development Officers belonging to the Combined Service can apply for these vacancies.

Sgd/ S. Alokabandara
Director General of Combined Services

Annex -01

| | Ministry | Institution | Number of vacant posts | Educational Qualifications | Address to which the applications should be sent | Telephone numbers for further inquiries |
|---|---|---|---|---|---|---|
| 01 | Ministry of Health | National Authority on Tobacco & Alcohol | 02 | Having a Bachelor's degree in any subject area which is recognized by the University Grant Commission | President,<br>National Authority on Tobacco & Alcohol,<br>11th Floor,<br>Wing A,<br>Sethsiripaya stage II,<br>Battaramulla<br>Email - natamoh.lk@gmail.com | 0112187140<br>Ms. Ruwini Wanninayake<br>Development Officer |
| 02 | Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government (Provincial Councils and Local Government Division) | Sri Lanka Institute of Local Governance | 05 | Having a Bachelor's degree in which is recognized by the University Grant Commission | Director/ Chief Executive Officer,<br>Sri Lanka Institute of Local Governance,<br>No: 17,<br>Malalasekara Mawatha,<br>Colombo 07.<br>Email - director@slilg.gov.lk | 0112508290<br>Dr. D.M.S Dissanayake,<br>Director/ Chief Executive Office |

Annex - 02

**Application to be attached to the posts that have fallen vacant in ………………………………..(institution) functioning under the purview of the Ministry of ……………………………….**

## Part I

(To be filled by the officer)

1. Name of the officer :-
   Mr./Mrs./Miss............................................................................
2. NIC number :- ...........................................................................................
3. Number of appointment :- ...........................................................................................
4. Date of appointment :- ...........................................................................................
5. Has been/ has not been confirmed in the appointment :-
   ...........................................................................................

---

## Part II

[To be filled by the Head of the …………………………………… (Ministry/ Department/Institution) where the officer is serving]

Mr./Mrs./Miss………………………………………….has been confirmed in the appointment of the Development Officers' Service on ………………….. (date). I hereby recommend that he/she can be released from the service with/ without replacement if he/she is selected for a post in …………………………….(institution).

Signature: ……………………………………………

Official Stamp : ……………………………………………